# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1980 අංක 5 දරන
# මහනුවර ජාතික කලා මණ්ඩලය
# (සංස්ථාගත කිරීමේ) පනත

**[සහතිකය සටහන් කළේ 1980 ජනවාරි මස 24 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1980 පෙබරවාරි මස 01 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

මිල : ශත 45 යි    තැපැල් ගාස්තුව : ශත 25 යි

# 1980 අංක 5 දරන මහනුවර ජාතික කලා මණ්ඩලය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1980 ජනවාරි මස 24 වන දින]

එල්. ඩී.—ඕ. 44/79

## මහනුවර ජාතික කලා මණ්ඩලය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

"මහනුවර ජාතික කලා මණ්ඩලය" යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන සංගමයක්, එහි සාමාජිකයන් එකඟ වූ රීති අනුව එකී සංගමයට සම්බන්ධ සියලු කාරණා එලදායී ලෙස කර ගෙන යාමේ හා ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා මෙතෙක් කල් මහනුවර පිහිටුවා තිබූ හෙයින් ද : පූර්විකාව.

එකී සංගමය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කාරණා සඳහා ද ඒ පරමාර්ථ හා කාරණා එකී සංගමය විසින් මෙතෙක් කල් සාර්ථක ලෙස කර ගෙන ගොස් ඇති හා ක්‍රියාත්මක කර ඇති හෙයින් සහ සංස්ථාගත කරනු ලැබීම සඳහා ඉල්ලුම් කර ඇති හෙයින් ද ඒ ඉල්ලීමට ඉඩදීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1980 අංක 5 දරන මහනුවර ජාතික කලා මණ්ඩලය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මේ පනත ආරම්භ වීමේ දින සිට සහ ඉන් පසු (මෙහි මින් මතු "සංගමය" යනුවෙන් සඳහන් කරනු ලබන) මහනුවර ජාතික කලා මණ්ඩලයේ දැනට සාමාජිකයන්ව සිටින හා සිටින තාක් තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවට මින් මතු ඇතුළත් කර ගනු ලබන සාමාජිකයන් ද "මහනුවර ජාතික කලා මණ්ඩලය" යන නාමය හා අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, පොදු මුද්‍රාවක් තබා ගෙන එය පාවිච්චි කිරීමේ ද ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරය ඇතිව සංස්ථාව විසින් එකී නාමයෙන් සියලු අධිකරණවල නඩු පැවරීම හා එයට විරුද්ධව නඩු පවරනු ලැබීම කළ යුතු ද කළ හැකි ද විය යුතු ය. මහනුවර ජාතික කලා මණ්ඩලය සංස්ථාගත කිරීම.

3. සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද ඒ පොදු පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:— සංස්ථාවේ පොදු පරමාර්ථ.

(අ) විශේෂයෙන් ම උඩරට, විවිධ ගණයේ කලාවන් සහ කලාකරුවන් ආරක්ෂා කිරීම, පුහුණු කිරීම, නංවාලීම, අගය කිරීම සහ සංවර්ධනය කිරීම පිණිස සංවිධානයක් පිහිටුවාලීම හා අංග සම්පූර්ණ කලා ශිල්ප කේන්ද්‍රස්ථානයක් පිහිටුවීම ;

(ආ) එබඳු කලාවන්ගේ සහ කලාකරුවන්ගේ සුභසිද්ධිය පිණිස අවශ්‍ය පියවර ගැනීම ;

(ඇ) කලාවන්ගේ සහ කලාකරුවන්ගේ විවිධ ගුරුකුල අතර, එකමුතුකම සහ අන්‍යෝන්‍ය සහයෝගතාව වර්ධනය කිරීමේ කාර්යය සඳහා වැඩ පිළිවෙලවල් සැකසුම් කිරීම ; සහ

2—ඒ 43020—10,500 (79/07)

(ඇ) ඉහත සඳහන් අරමුණු සහ පරමාර්ථ ප්‍රවර්ධනය කර ගැනී මෙහි ලා අවශ්‍ය වන්නාවූ හා යෝග්‍ය වන්නාවූ වෙනත් සියලුම පියවරවල් ගැනීම.

කළමනාකාර මණ්ඩලය.

4. (1) සංස්ථාවේ කටයුතු, සංස්ථාවේ තත් කාලයෙහි බල පවත්නා රීතිවලට අනුකූලව තෝරා පත් කරගනු ලබන තැනැත්තන් සංඛ්‍යාවකින් සමන්විත කළමනාකාර මණ්ඩලයක් විසින් සංස්ථාවේ තත් කාලයෙහි බලපවත්නා රීතිවලට යටත්ව, පරිපාලනය කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත ක්‍රියාත්මක වන අවස්ථාවේ සංගමයේ ධුර දරන කළමනාකාර මණ්ඩලයේ සාමාජිකයන් සංස්ථාවේ ප්‍රථම කළමනාකාර මණ්ඩලය විය යුතුය.

ප්‍රථම කළමනාකාර මණ්ඩලය පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය :—

1. සුදත් ගුණසේකර මහතා, ගරු සභාපති.

2. ධම්මප්‍රිය ගුණරත්න මහතා, ගරු ලේකම්.

3. ඩබ්ලිව්. ඉන්ද්‍රපාල මහතා, ගරු ප්‍රධාන සංවිධායක.

4. ඕ. ජී. ස්වර්ණසිංහ මහතා, ගරු භාණ්ඩාගාරික.

5. ආචාර්ය පාල්ලමුරේ සෝරත හිමි, සාමාජික.

6. ඒ. බී. හේරත් මහතා, සාමාජික.

7. ටී. බී. කරුණාරත්න මහතා, සාමාජික.

සංස්ථාවේ රීති.

5. (1) සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම හෝ ඔවුන් නෙරපීම සඳහා ද, කළමනාකාර මණ්ඩලයේ සහ සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ, අනුයෝජිතයන්ගේ සහ සේවකයන්ගේ කාර්ය කරගෙන යාම සඳහා ද, කටයුතු කිරීමෙහි ලා කාර්ය පටිපාටිය සම්බන්ධයෙන් ද, සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සඳහා සහ එහි පරමාර්ථ මුදුන්පත් කර ගැනීම සඳහා අන්‍යාකාරයකින් ද සාමාජිකයන්ගේ යම් මහා සභා රැස්වීමක දී වැඩි ඡන්දයෙන් සංස්ථාව විසින් කලින් කල රීති සෑදීම නීත්‍යනුකූල විය යුතුය. එවැනි රීති සාදනු ලැබූ විට එවැනි ම රැස්වීමක දී (2) වන උපවගන්තියේ නියමයන්ට යටත්ව, ඒවා වෙනස් කිරීම, ඒවාට යමක් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(2) තත්කාලයෙහි බලපවත්නා සංස්ථාවේ කිසිම රීතියක් හෝ මින් මතු සම්මත කරගනු ලබන යම් රීතියක් හෝ වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම, එය සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම සංස්ථාවේ මහා සභා රැස්වීමකට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකක ඡන්දයෙන් හැර, කරනු නො ලැබිය යුතු ය :

එසේ වුව ද ඒ වෙනස් කිරීම, එකතු කිරීම, සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම කළමනාකාර මණ්ඩලය විසින් අනුමත කරනු ලැබ තිබිය යුතු ය.

(3) මේ පනත ක්‍රියාත්මක වන අවස්ථාවේ දී බලපැවැත්වූ සංගමයේ රීති මේ වගන්තිය යටතේ සාදනු ලැබූ සංස්ථාවේ රීති ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) සංස්ථාවේ සියලුම සාමාජිකයන් තත් කාලයෙහි බලපවත්නා සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

6. මේ පනතේ කාර්ය සඳහා, මේ පනත ක්‍රියාත්මක වන අවස්ථාවේ පැවැති සංගමයේ සියලු ණය හා බැරකම්, මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, සංගමයට අයවිය යුතු සියලු ණය හා සංගමයට ගෙවිය යුතු සාමාජික මුදල් හා දායක මුදල් සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය. සංගමය විසින් ගෙවිය යුතු ණය හා සංගමයට අයවියයුතු ණය.

7. කළමනාකාර මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී හැර, සංස්ථාවේ මුද්‍රාව කවර හෝ සාධන පත්‍රයකට තබනු නො ලැබිය යුතු අතර, ඒ සාමාජිකයන් දෙදෙනා තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඒ සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතු ය. තව ද ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට බාහිරව විය යුතු ය. සංස්ථාවේ මුද්‍රාව තැබිය යුතු ආකාරය.

8. යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක් හෝ අන්තිම කැමති පත්‍රයකින් දේපළ බැහැර කිරීමක් ප්‍රකාර හෝ අන්‍යාකාරයකින් හෝ සංස්ථාව වෙත සතු කරනු ලැබිය හැකි චංචල හෝ නිශ්චල හෝ යම් දේපළක් ගැනීමට හා දැරීමට නීතිය අනුව හැකියාව හා ශක්තුතාව සංස්ථාවට තිබිය යුතු අතර, ඒ සියලු දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමේ සම්පූර්ණ බලය ඇතිව සංස්ථාවේ තත් කාලයෙහි බල පවත්නා රීතිවලට යටත් ව සංස්ථාව විසින් මේ පනතේ කාර්ය සඳහා ඒ සියලු දේපළ දරනු ලැබිය යුතු ය. සංස්ථාව විසින් චංචල හෝ නිශ්චල දේපළ දැරිය හැකි බව.

9. සංස්ථාවේ පරමාර්ථ මුදුන්පත් කර ගැනීම සඳහා සංස්ථාව විසින් මුදල් ලබා ගැනීම සහ ඒ කාර්යය සඳහා යම් උකස්, බැඳුම්කර හෝ බැදීම් සංස්ථාව විසින් ඇති කිරීම, ක්‍රියාවේ යෙදවීම, ප්‍රදානය කිරීම හෝ නිකුත් කිරීම නීත්‍යානුකූල විය යුතු ය: ණය ගැනීමේ බලතල.

එසේ වුව ද, සංස්ථාව විසින් එසේ ලබා ගත හැකි මුදල්වල එකතුව, කළමනාකාර මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන මුදල නොඉක්මවිය යුතු ය.

10. සංස්ථාව වෙනුවෙන් හා එහි ප්‍රතිලාභය සඳහා සංස්ථාවේ යම් සාමාජිකයකු, නිලධරයකු, අනුයෝජිතයකු, හෝ සේවකයකු විසින් සද්භාවයෙන් කරන ලද ගෙවීම්වල ප්‍රමාණයට, ඒ සාමාජිකයාට, නිලධරයාට, අනුයෝජිතයාට හෝ සේවකයාට සංස්ථාව විසින් ඒ මුදල ආපසු ගෙවනු ලැබිය යුතු ය. ආපසු ගෙවීම.

11. මේ පනතෙහි සඳහන් තැනැත්තන්ගේ හා ඔවුන් මගින්, ඔවුන්ගෙන් හා ඔවුන් යටතේ හිමිකම් පාන්නවුන්ගේ අයිතිවාසිකම්වලට හැර, ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තන්ගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නො විය යුතු ය. ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.